(අන්තර්ජාල අනුවාදයකි.)

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 19 දරන මාර්කෙස් ඉස්ලාමීය මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1999 ජූලි මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 ජූලි මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 5.75 තැපැල් ගාස්තුව : රු. 3.50

## 1999 අංක 19 දරන මාර්කෙස් ඉස්ලාමීය මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1999 ජූලි මස 06 වන දින]

එල්.ඩී.—ඕ. 22/98.

### මාර්කෙස් ඉස්ලාමීය මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"මාර්කෙස් ඉස්ලාමීය මධ්‍යස්ථානය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එම සංගමයට අදාළ සියලු පරමාර්ථ හා කරුණු කාර්යක්ෂමව ක්‍රියාත්මක කරමින් හා ඉටු කරගෙන ගොස් ඇති හෙයින් ද, එකී මාර්කෙස් ඉස්ලාමීය මධ්‍යස්ථානය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ මෙතෙක් කල් එකී මධ්‍යස්ථානය විසින් සාර්ථකව ඉටු කොට හා ක්‍රියාත්මක කොට ඇති හෙයින් ද, එකී මධ්‍යස්ථානය සංස්ථාගත කරනු ලැබීම සඳහා ඉල්ලීමක් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද, පූර්විකාව.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1999 අංක 19 දරන මාර්කෙස් ඉස්ලාමීය මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "මධ්‍යස්ථානය" යනුවෙන් සඳහන් කරනු ලබන) මාර්කෙස් ඉස්ලාමීය මධ්‍යස්ථානයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හා මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයන් ද "මාර්කෙස් ඉස්ලාමීය මධ්‍යස්ථානය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. මාර්කෙස් ඉස්ලාමීය මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම.

**3**. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ඉස්ලාමීය ධර්මය ඇදහීම දිරිගැන්වීම ;

(ආ) අරාබි භාෂාව, සාහිත්‍යය, ඉස්ලාම් ධර්මය, ඉතිහාසය සහ සංස්කෘතිය ඒවායේ සියලු අංශවලින් අධ්‍යයනය කිරීම හා ප්‍රවර්ධනය කිරීම, පෝෂණය කිරීම සහ දිරිගැන්වීම ;

(ඇ) දෙමළ, සිංහල, අරාබි හා ඉංග්‍රීසි භාෂාවලින් ඉස්ලාම් ධර්මයට අදාළව පර්යේෂණ කිරීම, ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) ඉස්ලාමීය සංස්කෘතිය හා සදාචාරය ප්‍රවර්ධනය කිරීම ;

(ඉ) ඉස්ලාම් ධර්මය හා ඉස්ලාමීය ජීවන ක්‍රමය අධ්‍යයනය කිරීම සඳහා පහසුකම් සැලසීම ;

(ඊ) ශ්‍රී ලංකාව ඇතුළත හා පිටත සමාන පරමාර්ථ සහිත ඉස්ලාමීය සංවිධාන සමග හිතවත් සම්බන්ධකම් ඇතිකරගෙන පවත්වා ගෙන යාම ;

(උ) ඉස්ලාම් ධර්මය පිළිබඳ පොත්, වාර සඟරා, සඟරා සහ පත්‍රිකා මුද්‍රණය කිරීම, පළ කිරීම හා බෙදා හැරීම ;

(ඌ) සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබන මුස්ලිම් සිසුන් සඳහා, ඉස්ලාම් ධර්මය පිළිබඳ සිංහලෙන් ලියැවුණු අධ්‍යාපනික පොත් පත් යනාදිය ලබාදීම ;

(එ) මාර්කෙස් ඉස්ලාමීය මධ්‍යස්ථානය පරිපාලනය, නඩත්තුව හා සංවර්ධනය ;

(ඒ) මාර්කෙස් ඉස්ලාමීය මධ්‍යස්ථානයේ ගොඩනැගිලි නඩත්තු කිරීම හා අවශ්‍ය නම් ඉස්ලාම් ධර්මය පිළිබඳ පන්ති, සම්මන්ත්‍රණ හා දේශන පැවැත්වීමේ කාර්යය සඳහා නව ගොඩනැගිලි පිහිටුවීම ;

(ඔ) මාර්කෙස් ඉස්ලාමීය මධ්‍යස්ථානයේ පුස්තකාලය හා දේශනශාලා නඩත්තු කිරීම හා අවශ්‍ය වේ නම් ඉස්ලාම් ධර්මය ඉගෙනගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා නව දේශන ශාලා හා පුස්තකාල ඉදිකිරීම ;

(ඕ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අරමුදල් ලැබීම ;

(ක) අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීම ;

(ග) සමාජ හා ආර්ථික ශුභසාධක කටයුතු ප්‍රවර්ධනය කිරීම ;

සංස්ථාවේ බලතල.

**4**. සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ හා වැසීමේ අයිතිය හා සංස්ථාවේ අරමුණු ඉටුකර ගැනීමේ දී නිලධරයන් හා සේවකයන් බඳවා ගැනීම, සේවයේ යෙදවීම හා සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ අරමුණු හෝ අරමුණක් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු කටයුතු, කරුණු හා දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරීම සහ බැහැර කිරීම කළ හැකි බව.

**5**. සංස්ථාවේ රීතිවලට යටත්ව, යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් මගින් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව සතු කරනු ලබන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ තබා ගැනීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, එකී සියලු දේපළ සංස්ථාව විසින් මේ පනතේ කාර්යය සඳහා දැරිය යුතු ය. තව ද, සංස්ථාවේ රීතිවලට යටත්ව, එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ද, සංස්ථාව සතු වන්නේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**6**. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ නීතිරීතිවලට යටත් ව, කළමනාකරණ කමිටුවක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ කමිටුව මේ පනතේ උපලේඛනයේ නම් සඳහන් වන, මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දැරූ මාර්කෙස් ඉස්ලාමීය මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටුව විය යුතු ය.

මධ්‍යස්ථානය විසින් ගෙවිය යුතු හා මධ්‍යස්ථානයට අයවිය යුතු ණය.

**7**. මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී මධ්‍යස්ථානයේ පැවති සියලුම ණය සහ බැරකම් මෙයින් පිහිටුවනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට මධ්‍යස්ථානයට අය විය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් හා සම්මාදම් මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

8. (1) පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් පවත්වා ගෙන යාමට සංස්ථාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(අ) සංස්ථාවට ලැබෙන සහ සංස්ථාව විසින් වියදම් කරනු ලබන සියලු මුදල් ;

(ආ) සංස්ථාවේ වත්කම් සහ බැරකම් ;

(2) සංස්ථාවේ ගිණුම් සහ ශේෂ පත්‍රය තත් කාර්යය සඳහා සංස්ථාව විසින් පත් කරනු ලැබූ සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරයන් විසින් යටත් පිරිසෙයින් වර්ෂයකට වරක්වත් විගණනය කරනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සහ ශේෂ පත්‍රය, යුක්ති සහගත සියලු වේලාවල දී සංස්ථාවේ සාමාජිකයන් විසින් පරීක්ෂා කර බලනු සඳහා විවෘතව තිබිය යුතු ය.

විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

9. කවර ආකාරයකින් ලැබුන ද, සංස්ථාවේ මුදල් හා දේපළ, මෙහි සඳහන් කොට ඇති සංස්ථාවේ අරමුණු ප්‍රවර්ධනය කිරීම සඳහා පමණක් යොදා ගත යුතු අතර, එයින් කවර හෝ කොටසක් ලාභ ගෙවීමක් ලෙස ලාභාංශ, ණය, ප්‍රසාද දීමනා හෝ වෙනත් දීමනාවක් වශයෙන්, සංස්ථාවේ සාමාජිකයන් හට කෙළින් ම හෝ අන්‍යාකාරයෙන් ගෙවීම හෝ පැවරීම නොකළ යුතු ය.

එසේ වුව ද,මේ වගන්තියේ විධිවිධානවලින් මෙහි පහත සඳහන් දේ තහනම් නොවිය යුතු ය :—

(අ) සංස්ථාවේ නිලධරයකුට හෝ සේවකටකුට හෝ සංස්ථාවේ සාමාජිකයකුට ඔහු විසින් සංස්ථාවට සලසන ලද සේවය වෙනුවෙන් යහපත් අරමුණින්, සාධාරණ හා නිසි පාරිශ්‍රමිකයක් ගෙවීම ;

(ආ) සංස්ථාවේ කවර හෝ සාමාජිකයෙක්, නිලධරයෙක් හෝ සේවකයකු විසින් ස්වකීය කර්තව්‍ය හෝ කාර්යය කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී හෝ සංස්ථාවේ අරමුණු ප්‍රවර්ධනය කිරීමේ දී දරන ලද සාධාරණ හා නිසි වියදම් කළමනාකරණ කමිටුවේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව, ප්‍රතිපූරණය කිරීම හෝ ආපසු ගෙවීම.

දේපල අත්කර ගැනීම, අරමුදල් ආයෝජනය කිරීම, ණය ගැනීම ආදිය පිළිබඳ සංස්ථාවේ බලතල.

10. සංස්ථාව විසින් :—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීම, අත්කර ගැනීම, කුලියට ගැනීම, ඉදි කිරීම හෝ අන්‍යාකාරයකින් ලබා ගැනීම සහ තත්කාර්ය සඳහා නීත්‍යානුකූලව අත්කර ගැනීම ද සංස්ථාවේ පරමාර්ථ නංවාලීමේ අරමුණ ඇතිව අවස්ථානුකූල යයි පෙනී යන විට ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම හෝ බැහැර කිරීම ද ;

(ආ) කළමනාකරණ කමිටුව සුදුසු යයි සිතන ආකාරයට, සංස්ථාවේ වැඩ කටයුතු සඳහා හදිසියෙන් අවශ්‍ය නොවන අරමුදල් කලින් කල ආයෝජනය කිරීම සහ එවැනි ආයෝජන වෙනස් කිරීම හා මාරු කිරීම ද ;

(ඇ) සංස්ථාවේ යම් කාර්යයක් සඳහා මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම සහ සංස්ථාවේ යම් ණයක් හෝ බැඳීමක් සුදුසු යයි අදහස් කරන ආකාරයට නිදහස් කිරීම ද ;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා දායක මුදල්, ප්‍රදාන සහ සියලු ආකාරයේ පරිත්‍යාග සහ තෑගි මෙරටින් හෝ විදේශයන්ගෙන් ලබා ගැනීම ද ;

(ඉ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය කවර හෝ ගොඩනැගිල්ලක් ඉදි කිරීම, වෙනස් කිරීම හා නඩත්තු කිරීම ද ;

(ඊ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙන් පහ කිරීම හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීම සහ කළමනාකරණ කමිටුව විසින් කලින් කල තීරණය කරනු ලබන වැටුප්, විශ්‍රාම වැටුප්, පාරිතෝෂික සහ දීමනා ඔවුන්ට ගෙවීම ද ;

(උ) සංස්ථාවේ කලින් සිටි හෝ දැනට සිටින සේවකයන්ට හෝ ඔවුන්ගේ ඥාතීන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට, පාරිතෝෂික, විශ්‍රාම වැටුප්, දීමනා හෝ වෙනත් ප්‍රතිලාභ ප්‍රදානය කිරීම පිණිස වූ යම් අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් පිහිටුවීම හෝ එවැනි අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායකවීම ද ;

(ඌ) සංස්ථාවේ අරමුණු ප්‍රවර්ධනය කිරීම සඳහා, සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද යම් තැනැත්තකු, සමාගමක්, සමිතියක් හෝ පුද්ගල මණ්ඩලයක් සමග යම් ගිවිසුමකට එළඹීම ද ;

(එ) සංස්ථාවේ කාර්ය සඳහා දීමනා, පරිත්‍යාග හෝ ශිෂ්‍යත්ව ලබාදීම ද ;

(ඒ) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ අරමුණු නිසි පරිදි ඵලදායි අයුරින් කරගෙන යෑම සඳහා අවශ්‍ය හෝ අවස්ථානුකූල, මේ පනතට හෝ වෙනත් යම් නීතියකට අනුකූල නොවන්නා වූ වෙනත් සියලු දේ කිරීම ද ;

නීත්‍යානුකූල වන්නේ ය.

සංස්ථාවේ මුද්‍රාව.

**11**. සංස්ථාවේ මුද්‍රාව, කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එසේ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12**. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන තැනැත්තන් හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**13**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**"අ" උපලේඛනය** **(6 වන වගන්තිය)**

කළමනාකරණ කමිටුව

1. අබ්දුල් රහීම් මරික්කාර් මොහොමඩ් නජිබ්ඩීන් මහතා
2. මොහොමඩ් සලීම් මොහොමඩ් ෆාරුක් මහතා
3. අබ්දුල් රහමාන් ලෙබ්බෙ මොහොමඩ් ලෙබ්බෙ මහතා
4. අබ්දුල් ජබ්බාර් මොහොමඩ් ජබීර් මහතා
5. අබ්දුල් වඩූඩ් මොහොමඩ් ෆාරුක් මහතා
6. මොහොමඩ් හුසේන් මොහොමඩ් ෆුආඩ් මහතා
7. ෂාහුල් හමීඩ් සෙයෙඩ් මොහොමඩ් ඕමාර් මහතා
8. මොහොඩීන් මොහොමඩ් අන්සාර් මහතා

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.